# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2189/9 - 2020 අගෝස්තු මස 19 වැනි බදාදා - 2020.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :* 4/1/ඉ/අත්පත්/106/2018.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:*
4-3/9/2018/එන්ආර්ඩී/288.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍යවන පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප අතුරු විධානය යටතේමෙයින් දැනුම් දෙමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 713 මැහිඇල්ල උතුර ග්‍රාම නිලධාරි වසමේ, මැහිඇල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ 2020.07.30 දිනැති, ක.සි. 420202/කළාප අංක 07/පත්‍ර අංක 07 හි කැබලි අංක 215,217 සහ 220 (කැබලි 03) ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් 0.8024 පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි:

01. **කැබලි අංක 215**
ඉඩමේ නම: දංගොල්ලවත්ත; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය, අංක 65 කැබැල්ලෙන් කොටසක්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී. මුල් හිමිකම් පාන්නා; එම්. එෆ්. කලීල්; අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්ටෙයාර් 0.7869.

02. **කැබලි අංක 217**
ඉඩමේ නම: -; ඉඩමේ විස්තරය: ඇළ; හිමිකම් කියන අය: රජය: අංක 82 කැබැල්ලෙන් කොටසක්, කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගය සඳහා අවශ්‍යව ඇත; ප්‍රමාණය: හෙක්ටෙයාර් 0.0020. (ව.මී.20).

03. **කැබලි අංක 220**
ඉඩමේ නම: -; ඉඩමේ විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය: අංක 81 කැබැල්ලෙන් කොටසක්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී. මුල් හිමිකම් පාන්නා; සොයාගත නොහැක; අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්ටෙයාර් 0.0135. (ව.මී.135).

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.09.28 වැනි දින පෙ.ව 10.00 ට පෙර මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2020.09.14 දිනට මත්තෙන් ඒ ඉඩම/පරවශතාවය සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එන්. ඒ. ඒ. එස්. ප්‍රියංකර,
ප්‍රාදේශීය ලේකම්/මල්ලවපිටිය.

2020 අගෝස්තු මස 14 වැනි දින,
මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 10


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය :* KDS/AKU/4/2/1/55.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය:*
4-3/9/2015/WS/133.

උක්ත ශීර්ෂය යටතේ 2020 පෙබරවාරි 10 වැනි දින අංක 2162/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 02-515 යටතේ ම විසින් පළ කරන ලද දැන්වීමෙහි සඳහන් පරීක්ෂණ දිනයන්, වේලාවන් හා අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතු දිනයන් ඉවත් කොට, ඒ වෙනුවට වෙනත් දිනයන් හා වේලාවන් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනයන් හා වේලාවන්* | *ඉවත් කළ දින වෙනුවට ආදේශ කළ යුතු දිනයන් හා වේලාවන්* |
|---|---|
| 2020 මාර්තු මස 31 වැනි දින පෙ.ව. 11.30 | 2020 සැප්තැම්බර් මස 29 වැනි දින පෙ.ව. 11.30 |
| 2020 මාර්තු මස 16 දින | 2020 සැප්තැම්බර් මස 22 වැනි දින |

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
අකුරණ.

2020 අගෝස්තු මස 14 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 14

---

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය :* KDS/AKU/4/2/1/57.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය:*
4-3/9/2015/WS/130.

උක්ත ශීර්ෂය යටතේ 2020 පෙබරවාරි 10 වැනි දින අංක 2162/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 02-516 යටතේ ම විසින් පළ කරන ලද දැන්වීමෙහි සඳහන් පරීක්ෂණ දිනයන්, වේලාවන් හා අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතු දිනයන් ඉවත් කොට, ඒ වෙනුවට වෙනත් දිනයන් හා වේලාවන් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනයන් හා වේලාවන්* | *ඉවත් කළ දින වෙනුවට ආදේශ කළ යුතු දිනයන් හා වේලාවන්* |
|---|---|
| 2020 මාර්තු මස 31 වැනි දින පෙ.ව. 10.00 | 2020 සැප්තැම්බර් මස 29 වැනි දින පෙ.ව. 10.00 |
| 2020 මාර්තු මස 16 දින | 2020 සැප්තැම්බර් මස 22 වැනි දින |

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
අකුරණ.

2020 අගෝස්තු මස 14 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 35

---

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය :* KDS/AKU/4/2/1/61.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය:*
4-3/9/2015/WS/113.

උක්ත ශීර්ෂය යටතේ 2020 මාර්තු මස 10 වැනි දින අංක 2166/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 03-914 යටතේ ම විසින් පළ කරන ලද දැන්වීමෙහි සඳහන් පරීක්ෂණ දිනයන්, වේලාවන් හා අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතු දිනයන් ඉවත් කොට, ඒ වෙනුවට වෙනත් දිනයන් හා වේලාවන් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනයන් හා වේලාවන්* | *ඉවත් කළ දින වෙනුවට ආදේශ කළ යුතු දිනයන් හා වේලාවන්* |
|---|---|
| 2020 මැයි මස 06 වැනි දින පෙ.ව. 10.00 | 2020 සැප්තැම්බර් මස 29 වැනි දින ප.ව. 2.00 |
| 2020 අප්‍රේල් මස 29 දින | 2020 සැප්තැම්බර් මස 22 වැනි දින |

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
අකුරණ.

2020 අගෝස්තු මස 14 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 36

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.